අවසන් දිනය - **2025.05.07**

# ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

## <u>පුරප්පාඩු</u>

ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක පහත සඳහන් ව්‍යාපෘතිවල **ව්‍යාපෘති අධ්‍යක්ෂ** සහ **නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ** යන තනතුරු සඳහා රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ මාර්ග සංවර්ධන අධිකාරියේ ස්ථිර නිලධරයන් ද ඇතුළුව සියලුම ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම පත්වීම් 2019.03.05 දිනැතිව මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කළ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019හි සඳහන් විධිවිධානවලට යටත් වනු ඇත.

| **ව්‍යාපෘතියේ නම** | **ව්‍යාපෘති වටිනාකම (ඇ.ඩො. මිලියන)** | **තනතුරු නාමය** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|
| බදුල්ල චෙංකලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | ඇ.ඩො. මිලියන (15-50) කාණ්ඩය | ව්‍යාපෘති අධ්‍යක්ෂ | **01** |
| | | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ | **01** |
| විවිධ විදේශාධාර ව්‍යාපෘතිය (MFAP) | ඇ.ඩො. මිලියන (50-100) කාණ්ඩය | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ | **01** |
| මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය (KMTTDP) | | ව්‍යාපෘති අධ්‍යක්ෂ | **01** |
| මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - තුන්වන අදියර (CEP III) | ඇ.ඩො. මිලියන 250ට වැඩි කාණ්ඩය | ව්‍යාපෘති අධ්‍යක්ෂ | **01** |
| | | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ | **01** |
| වරාය පිවිසුම් ගුවන් මාර්ග ව්‍යාපෘතිය (PAEHP) | | ව්‍යාපෘති අධ්‍යක්ෂ | **01** |
| | | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ | **01** |

**යථෝක්ත කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019හි ඇමුණුම 01 ප්‍රකාරව ව්‍යාපෘති අධ්‍යක්ෂ (PS 01) තනතුරේ මූලික සුදුසුකම් පහතින් සඳහන් කර ඇත**

| මූලික අධ්‍යාපන සුදුසුකම් | ව්‍යාපෘතියේ වටිනාකම අනුව සුදුසුකම් ලැබීමෙන් අනතුරුව තිබිය යුතු පශ්චාත් පළපුරුද්ද | | |
|---|---|---|---|
| පහත (1) හෝ (2) හෝ (3) | (ඇ.ඩො මිලියන 15-50 කාණ්ඩය) | (ඇ.ඩො මිලියන 50-100 කාණ්ඩය) | ඇ.ඩො. මිලියන 250ට වැඩි කාණ්ඩය |
| **01)** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිම කළ ප්‍රථම උපාධියක්<br>හෝ<br>අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් සුදුසුකමක්<br>හෝ<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අනුබද්ධ සාමාජිකත්වය/ඒ හා සමාන වෘත්තීය සුදුසුකම් | සහ<br>කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10ක, ඉන් වසර 05ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය. | සහ<br>කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12ක, ඉන් වසර 06ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය. | සහ<br>කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 16ක, ඉන් වසර 08ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය. |
| **02)** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිම කළ ප්‍රථම උපාධියක්<br>හෝ<br>අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් සුදුසුකමක්<br>හෝ<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අනුබද්ධ සාමාජිකත්වය/ඒ හා සමාන වෘත්තීය සුදුසුකම්<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමායත/වරලත් සාමාජිකත්වය හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක් | සමග<br>කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 08ක, ඉන් වසර 04ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය. | සමග<br>කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10ක, ඉන් වසර 05ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය. | සමග<br>කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 14ක, ඉන් වසර 07ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය. |
| **03)** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිම කළ ප්‍රථම උපාධියක්<br>හෝ<br>අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් සුදුසුකමක්<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්<br>සමග<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමායත/වරලත් සාමාජිකත්වය හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක් | සමග<br>කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 06ක, ඉන් වසර 03ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය. | සමග<br>කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 08ක, ඉන් වසර 04ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය. | සමග<br>කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12ක, ඉන් වසර 06ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය. |

**<u>නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (PS 02) තනතුරේ මූලික සුදුසුකම් පහතින් සඳහන් කර ඇත</u>**

| මූලික අධ්‍යාපන සුදුසුකම් | ව්‍යාපෘතියේ වටිනාකම අනුව සුදුසුකම් ලැබීමෙන් අනතුරුව තිබිය යුතු පශ්චාත් පළපුරුද්ද | | |
|---|---|---|---|
| **පහත (1) හෝ (2) හෝ (3)** | **(ඇ.ඩො මිලියන 15-50 කාණ්ඩය)** | **(ඇ.ඩො මිලියන 50-100 කාණ්ඩය)** | **ඇ.ඩො. මිලියන 250ට වැඩි කාණ්ඩය** |
| **01 )** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිම කළ ප්‍රථම උපාධියක්<br>හෝ<br>අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් සුදුසුකමක්<br>හෝ<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අනුබද්ධ සාමාජිකත්වය/ඒ හා සමාන වෘත්තීය සුදුසුකම් | සහ<br>සුදුසුකම් ලැබීමෙන් අනතුරුව කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 09ක පශ්චාත් පළපුරුද්ද, ඉන් වසර 04ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය. | සහ<br>සුදුසුකම් ලැබීමෙන් අනතුරුව කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 11ක පශ්චාත් පළපුරුද්ද, ඉන් වසර 05ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය. | සහ<br>සුදුසුකම් ලැබීමෙන් අනතුරුව කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15ක පශ්චාත් පළපුරුද්ද, ඉන් වසර 07ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය. |
| **02)** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිම කළ ප්‍රථම උපාධියක්<br>හෝ<br>අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් සුදුසුකමක්<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමායත/වරලත් සාමාජිකත්වය හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක් | හෝ<br>අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සමග එම සුදුසුකම් ලැබීමෙන් අනතුරුව කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 07ක පශ්චාත් පළපුරුද්ද, ඉන් වසර 03ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය. | හෝ<br>අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සමග එම සුදුසුකම් ලැබීමෙන් අනතුරුව කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 09ක පශ්චාත් පළපුරුද්ද, ඉන් වසර 04ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය. | හෝ<br>අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සමග එම සුදුසුකම් ලැබීමෙන් අනතුරුව කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 13ක පශ්චාත් පළපුරුද්ද, ඉන් වසර 06ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය. |
| **03)** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිම කළ ප්‍රථම උපාධියක්<br>හෝ<br>අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් සුදුසුකමක්<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්<br>සහ<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමායත/වරලත් සාමාජිකත්වය හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක් | සමග<br>සුදුසුකම් ලැබීමෙන් අනතුරුව කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 05ක පශ්චාත් පළපුරුද්ද, ඉන් වසර 02ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය. | සමග<br>සුදුසුකම් ලැබීමෙන් අනතුරුව කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 07ක පශ්චාත් පළපුරුද්ද, ඉන් වසර 03ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය. | සමග<br>සුදුසුකම් ලැබීමෙන් අනතුරුව කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 11ක පශ්චාත් පළපුරුද්ද, ඉන් වසර 05ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය. |
| **04)** රජයේ දීප ව්‍යාප්ත සේවාවක පළමු ශ්‍රේණියේ නිලධරයෙකු හෝ අදාළ ක්ෂේත්‍රයේ ඒ හා සමාන තත්ත්වයක් දරන නිලධරයකු වීම | සමග<br>පළමු ශ්‍රේණියේ තනතුරේ අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද | සමග<br>පළමු ශ්‍රේණියේ තනතුරේ අවම වශයෙන් වසර 04ක පළපුරුද්ද | සමග<br>පළමු ශ්‍රේණියේ තනතුරේ අවම වශයෙන් වසර 06ක පළපුරුද්ද |

සටහන -

- **අදාළ ක්ෂේත්‍රය යන්නෙන් අදහස් වන්නේ "සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය" වන අතර, පළපුරුද්ද ද අදාළ ක්ෂේත්‍රයේ ම පැවතිය යුතු ය.**

---

**<u>සාමාන්‍ය කොන්දේසි :</u>**

- බඳවා ගැනීම, වැටුප, ප්‍රතිලාභ සහ අනෙකුත් සේවා කොන්දේසි 2019.03.05 දිනැතිව මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2019 හි දක්වා ඇති විධිවිධාන ප්‍රකාර වේ.
- තෝරා ගැනීම්, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ අනෙකුත් චක්‍රලේඛමය කොන්දේසි මත පදනම් වේ.
- මෙම චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘතියට අනුව සියලුම අයදුම්පත් සම්පූර්ණ කර, අදාළ ලේඛනවල සියලුම පිටපත් සමග එවිය යුතු ය.
- එක් ව්‍යාපෘතියකට වැඩි ගණනකට අයදුම් කරන්නේ නම්, ඒ සියල්ල එක ම අයදුම් පතේ සඳහන් කළ යුතු ය.
- තෝරාගනු ලැබුවහොත් අපේක්ෂකයින් දිවයිනේ සහ/හෝ ප්‍රදේශයේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට එකඟ විය යුතු ය.

**01. වයස් සීමාව:**

- රාජ්‍ය,අර්ධ රාජ්‍ය/මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධරයන් සඳහා වයස 60ට අඩු
- අනෙකුත් අයදුම්කරුවන් සඳහා වයස 64ට අඩු

**02 වැටුප:**

- මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 අනුව වැටුප් සහ දීමනා ගෙවනු ලැබේ.

**03. සේවා නියුක්ති කොන්දේසි:**

- මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත ප්‍රථමයෙන් වසරක කාලයක් සඳහා ය. සේවා අවශ්‍යතාව සහ කාර්ය සාධනය මත පදනම්ව දිගුවක් සඳහා සලකා බැලිය හැකි ය.

- අයදුම්කරු දැනටමත් මාර්ග සංවර්ධන අධිකාරියේ ස්ථිර තනතුරක් දරන්නේ නම්, මෙම පත්වීම නිත්‍ය තනතුරේ පත්කිරීම් බලධරයා විසින් නිර්දේශ කරනු ලබන කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019හි 2.3.3 ඡේදයේ සඳහන් මුදාහැරීමේ පදනම සහ යථා පරිදි මුදාහැරීම මත පදනම් වනු ඇත.

- අයදුම්පත් නිසි පරිදි පුරවා නැති සහ අයදුම් පත සමග නිවැරදි දත්ත සපයා නැති සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019හි දක්වා ඇති අනෙකුත් අවශ්‍යතා සහ සුදුසුකම් සපුරා නැති අයදුම්කරුවන් පත්වීම් සඳහා සලකා නොබැලේ.

- සේවා දිගු ලබා දීමේ සහ පත්වීම් ප්‍රදානය කිරීමේ තීරණය, චක්‍රලේඛ සහ අනෙකුත් විධිවිධාන ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්වරයාගේ අභිමතය පරිදි සිදු කෙරේ.

**04. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

මාර්ග සංවර්ධන අධිකාරියේ/රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයක දැනටමත් ස්ථිර තනතුරක් දරන අයදුම්කරුවෙකු තම අයදුම්පත් කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2019හි 2.3.3 ඡේදයට අනුව නිත්‍ය තනතුරෙන් මුදා හැරීමේ සහතිකය සහ මුදාහැරීමේ පදනමේ නිර්දේශය ද සහිතව සිය ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය (එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ).

**05. අයදුම්පත යොමු කිරීම**

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහතින් දී ඇති ආකෘතිය අනුව පුරවා අධ්‍යාපන සුදුසුකම්, සේවා පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු ද සමග 2025.05.07 දිනට හෝ එදිනට පෙර **ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, "මගනැගුම මහමැදුර", අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත බහා එවන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ නිවේදනයේ දැක්වෙන ආකාරයට තනතුරේ සහ ව්‍යාපෘතියේ නම සඳහන් කරන්න.

**06. විශේෂ අවධානය සඳහා**

- **දී ඇති ආකෘතියට අනුකූලව නිසි පරිදි පුරවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
- **තෝරා ගැනීම සඳහා සලකා බලනුයේ අයදුම්පත සමග සහතිකවල පිටපත් ඉදිරිපත් කළ සුදුසුකම් පමණි.**

අයදුම්පත් ආකෘතිය - ඇමුණුම

වැඩිදුර විමසීම් සඳහා - 0112887472

**ලේකම්**
**ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය**